# මහනුවර මහා නගර සභාවේ තොරතුරු තාක්ෂණ නිපුණතා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම - 2023

1987 අංක 19 දරන මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරිය) 40(1) වගන්තිය යටතේ තොරතුරු තාක්ෂණ නිපුණතා නිලධාරි තනතුර සඳහා මහනුවර මහා නගර සභා බල ප්‍රදේශයේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය (කොන්ත්‍රාත් පදනම මත) :

1.1 බඳවා ගැනීමේ පොදු කොන්දේසි :

1.1.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

1.1.2 අයදුම්කරුවන් මධ්‍යම පළාත තුළ පදිංචි අයදුම්කරුවන් විය යුතුය. (අයදුම්කරුවන්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක (03ක) කාලයක් මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු බවට සනාථ කෙරෙන ලියවිලි සම්මුඛ පරීක්ෂණයේදී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය.)

1.1.3 අයදුම්කරුවන්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු හා වයස අවු. 35 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයන් හට මෙම තනතුරු සඳහා ඉල්ලුම් කළ නොහැක.

1.1.4 අයදුම්කරුවන්, විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතුය.

1.1.5 සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

- **සටහන**

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

1.2 *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1.2.1 මෙම තනතුර මහනුවර මහා නගර සභාවේ ගරු මහා සභා අනුමැතිය මත සේවා අවශ්‍යතාවය සලකා පිහිටුවා ගනු ලබන තනතුරක් වන අතර මහා නගර සභා ආඥාපනතේ (40) 1, (ආ), (ආ), (ඇ) (ඇ) යන විධිවිධානයන්ට යටත් වේ. මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිතය. ගරු මහා සභාව විසින් හෝ නාගරික කොමසාරිස්වරයා විසින් සේවා අවශ්‍යතාවය මත නිර්ණය කරනු ලබන කාල සීමාවන් සඳහා සේවයේ නියුක්ත කරවනු ලබයි. එසේ ම මෙම තනතුරු සම්බන්ධව ගරු මහා සභාව හෝ නාගරික කොමසාරිස්වරයා ඉදිරියේදී ගනු ලැබිය හැකි තීරණයන් ට මෙහි සඳහන් කරුණු යටත් වේ.

1.2.2 *මාසික දීමනාව .-* තොරතුරු තාක්ෂණ නිපුණතා නිලධාරි තනතුර සඳහා හිමි මාසික දීමනාව රු. 50,000.00 කි.

2. තනතුර හා අධ්‍යාපන සුදුසුකම් :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *බඳවා ගැනීමට අවශ්‍ය උපරිම තනතුරු ගණන* | *වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* | *අධ්‍යාපන සුදුසුකම්* | *රාජකාරී ස්වභාවය* |
|---|---|---|---|---|---|
| 01 | තොරතුරු තාක්ෂණ නිපුණතා නිලධාරී | 01 | 1. අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) වෘත්තීය පළපුරුද්ද ලබා තිබීම | අධ්‍යයන පොදු සහතික පත්‍ර සා. පෙළ විභාග යේ දී සිංහල, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුලු සම්මාන 05ක් සහිතව විෂයන් 06කින් එකවර සමත්වීම හා අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් විෂයන් 03 ක් (සාමාන්‍ය ඉංග්‍රීසි හැර සමත්වීම) *හා* | |

| අනු. අංකය | තනතුරු නාමය | බඳවා ගැනීමට අවශ්‍ය උපරිම තනතුරු ගණන | වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | අධ්‍යාපන සුදුසුකම් | රාජකාරී ස්වභාවය |
|---|---|---|---|---|---|
| | | | | 1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.<br>*හෝ*<br>2.I විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් සහිත උපාධියක් ලබා තිබීම (මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය විය යුතුය.)<br>*සහ*<br>II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.<br>*හෝ*<br>3.I විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් උපාධියක් ලබා තිබීම; *සහ*<br>II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br>*හෝ* | |

| අනු. අංකය | තනතුරු නාමය | බඳවා ගැනීමට අවශ්‍ය උපරිම තනතුරු ගණන | වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | අධ්‍යාපන සුදුසුකම් | රාජකාරි ස්වභාවය |
|---|---|---|---|---|---|
| | | | | 4. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ 7) හත මට්ටම හෝ ඊට ඉහළ (NVQ) සහතිකයක් ලබා තිබීම. | |

** ඉහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමේ දී මහනුවර මහා නගර සභාවේ පවතින සේවා අවශ්‍යතාවය සළකා ඒ අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :* 100% විවෘත පදනම මත

- ඉදිරිපත් කර ඇති අයදුම්පත් අතුරින් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කර ඉහළ ම ලකුණු ලබා ගන්නා අයදුම්කරු බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පහත අංශ කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

| | පරීක්ෂාකර ලකුණු ලබාදෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුම | 50 | උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩුව අනුව තෝරා ගනු ලැබේ. |
| 02 | අතිරේක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් | 15 | |
| 03 | වෘත්තීය පළපුරුද්ද (එක් අවුරුද්දක පළපුරුද්ද සඳහා ලකුණු 5 බැගින් උපරිම අවු. 05 ක් සඳහා) | 25 | |
| 04 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 10 | |
| | මුළු ලකුණු | 100 | |

04. අයදුම් කළයුතු ආකාරය :

4.1 මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි (A4) 12 x 8'27 ප්‍රමාණයේ පිටුවල දෙපසම භාවිතා කරමින් අයදුම්පතක් සකස් කර **2023 ජනවාරි මස 15 දිනට** හෝ ඊට පෙර නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4.2 ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ අයදුම් කරන තනතුර අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

4.3 නියමිත දිනට නොලැබෙන අයදුම්පත් දැනුම දීමකින් තොරව ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

4.4 අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය.

01. උප්පැන්න සහතිකය;
02. අධ්‍යාපන සහතිකය;
03. පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරී විසින් මාස තුනක කාලයක් තුළ නිකුත් කරන ලද සහතිකය;
04. මෑතකදී ලබාගත් චරිත සහතිකය;
05. වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
06. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත.

(මුල් පිටපත සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු බැවින් මුල් පිටපත් එවීමෙන් වළකින ලෙස කාරුණිකව දන්වමි.)

කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,
මහනුවර නාගරික කොමසාරිස්,

2022 දෙසැම්බර් මස 22 වැනි දින,
මහනුවර මහා නගර සභාවේ දී ය.